(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

**අංක 23.]**

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 පෙබරවාරි 06 වැනි බදාදා අ.භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

අතිගරු **මෛත්‍රීපාල සිරිසේන මහතා,** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අජිත් මාන්නප්පෙරුම මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍ය

ගරු **රන්ජන් රාමනායක මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වඩිවේල් සුරේෂ් මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **මහින්ද අමරවීර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **ටී. බී. ඒකනායක මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වසන්ත සේනානායක මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු විජිත් විජයමුණි සොයිසා මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115හි විධිවිධාන සහ 2019 ජනවාරි 8 සහ 11 දිනවලදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාවල කුමක් සඳහන්ව තිබුණද, 2019 ජනවාරි 11 දින නිවේදනය කරන ලද මන්ත්‍රීවරයන්ට අමතරව, 2019 පෙබරවාරි 5 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනා ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන් ද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු විමල් වීරවංශ මහතා"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

(i) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIII කොටස සහ නවවැනි කාණ්ඩයේ VII කොටස; සහ

(ii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ V සහ VI කොටස් සහ දසවැනි කාණ්ඩයේ XXXI කොටස

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, **සභා සම්මත විය.**

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2018 ජූලි 10 දිනැති අංක 2079/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(ii) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2018 ඔක්තෝබර් 08 දිනැති අංක 2092/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය); සහ

(iii) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව
(2018 නොවැම්බර් 15 දිනැති අංක 2097/36 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

පිළිගන්වා, එම යෝජනා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද, "(81 අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 6 සහ 10 වගන්ති යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) අක්කරපත්තුව - 01, බදූර් පල්ලිය පාර, අංක 115 සී දරන ස්ථානයෙහි පදිංචි ආර්. එම්. අස්කි මහතාගෙන් ලැබුණු 2018.08.06 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(2) (i) මහ ඉඳුරුව, අගතුඩුව, ගාලු පාර යන ලිපිනයෙහි පදිංචි ඒ. එෆ්. එස්. ද සොයිසා මහතාගෙන් ලැබුණු 2018.09.06 දිනැති පෙත්සම;

(ii) දොඩන්ගොඩ, නෑහින්න, දෙල්ගස් හංදිය, "අහිංසා" යන ලිපිනයෙහි පදිංචි ඒ. එස්. නිරෝෂිනී ද සිල්වා මහත්මියගෙන් ලැබුණු 2018.08.05 දිනැති පෙත්සම;

(iii) බෙන්තොට, මිරිස්වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. ජී. සමන් ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු 2018.09.16 දිනැති පෙත්සම;

(iv) පන්නිපිටිය, කලල්ගොඩ, අංක 45/එච්/1/1 දරන ස්ථානයෙහි පදිංචි එම්. බී. ද එස්. ජයතිලක මහතාගෙන් ලැබුණු 2018.06.05 දිනැති පෙත්සම; සහ

(v) බදුරලිය, ආඩියාවල යන ලිපිනයෙහි පදිංචි එන්. ඩබ්ලිව්. කේ. එස්. සේනානායක මහතාගෙන් ලැබුණු 2018.09.09 දිනැති පෙත්සම

ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(3) තංගල්ල, නෙටෝල්පිටිය, තිස්ස පාර, අංක 39 දරන ස්ථානයෙහි පදිංචි දොඩම්පහල හේවාගේ ජගත් ශ්‍රී දර්ශන මහතාගෙන් ලැබුණු 2018.07.07 දිනැති පෙත්සම ගරු මහින්ද අමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) මිහින්තලය, පොලිස් නිවාස, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි බී. එස්. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු 2018.10.05 දිනැති පෙත්සම; සහ

(ii) පිළියන්දල, හොන්නන්තර (දකුණ), කුඩමාදුව පාර, මූණමල්ගහවත්ත, අංක 108 E දරන ස්ථානයෙහි පදිංචි චන්ද්‍රිකා ඒකනායක මෙනෙවියගෙන් ලැබුණු 2018.09.10 දිනැති පෙත්සම

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉල්ලා අස්කර ගැනීමේ අවසරය :** ගරු එඩ්වඩ් ගුණසේකර මහතා ඉදිරිපත් කළ යෝජනාව,— 2017 මැයි 03 දින ඉදිරිපත් කරන ලද "පිළිකා සරණ භාරය (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගැනීමට අවසර දිය යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. වරදකරුවන් භාරදීමේ පනත යටතේ නියමය :** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1995 අංක 5 දරන වරදකරුවන් භාරදීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ඔක්තෝබර් 02 දිනැති අංක 2091/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.10.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අ. භා. 2.25 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය යුතුය"යි වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.18 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

"ගරු සුජිත් සංජය පෙරේරා මහතා මූලාසනාරූඪ විය යුතුය"යි අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.10 ට ගරු සුජිත් සංජය පෙරේරා මහතා මූලාසනාරූඪ විය.)

"ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.40 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

(අ. භා. 4.50 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ණය සහනදායක ආඥාපනත යටතේ නියෝග :** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය ඉදිරිපත් කළ යෝජනාව,— (81 අධිකාරය) ණය සහනදායක ආඥාපනතේ 63 වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 6 සහ 10 වගන්ති යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජනවාරි 03 දිනැති අංක 2104/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම (මූලධර්මවාදී ත්‍රස්ත ක්‍රියාකාරකම් මතුවීමට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු හෙක්ටර් අප්පුහාමි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ගරු සන්දිත් සමරසිංහ මහතා, ගරු මුහම්මදු නසීර් මහතා විසින් ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 6.02 ට ගරු හෙක්ටර් අප්පුහාමි මහතා මූලාසනාරූඪ විය.)

"ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 6.22 ට ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 6.55 ට, 2019 පෙබරවාරි 07 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.